*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2026 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,488 - 2026 මැයි මස 08 සිකුරාදා - 2026.05.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු අ ැබෑර්තු ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 766 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | 770 |


*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2026.04.24 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 29 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 15 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


765- B 082790 — (2026/05)
F 1 -

# පළාත් පාලන නිවේදන

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය


යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ වූ කාර්යය පටිපාටිය අනුගමනය කිරීම සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 02 වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,460 හා 2025.10.24 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුනා වූ ඊට අදාළ නිවේදනය යටතේ උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වාගෙන යනු ලබන මංමාවත්/පාරවල් ලෙස මෙයින් නිවේදනය කරමි.

නලින් එරන්ද පිටියේකුඹුර,<br>
සභාපති,<br>
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 22 දින,<br>
පිළිමතලාව,<br>
ඇඹිල්මීගම,<br>
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | හෙට්ටිවත්ත සමිති ශාලාව අසල මාර්ගය | දියපළාගොඩ | හෙට්ටිවත්ත සමිති ශාලාව අසලින් | එච්. ජී. කේ. රත්නායක මයාගේ නිවස අසලින් | 1. යූ. ජී. සී. එල්. කුමාර මයා<br>2. ඩබ්. ජී. ඉන්ද්‍රාවතී මිය<br>3. එච්. ජී. රංජිත් ප්‍රේමසිංහ මයා<br>4. ඒ. ඒ. සමන් කුමාර මයා<br>5. ආර්. එෆ්. විමලරත්න මයා<br>6. එච්. ජී. එස්. පත්මසිරි මයා | 1. හෙට්ටිවත්ත එක්සත් සුභ සාධක සමිතිය | අඩි 175 | අඩි 10 | 10788 |


පිඹුරු අංක 6043
විස්තරය
ස් - ස්ථිර ගොඩනැගිල්ල
ක - කණුව
කො - කොන්ක්‍රීට් කණුව
ආතා - ආධාරක තාප්පය
පැවැ - පැළ ඉණි වැට
වික - විදුලි කණුව
වැ - වැටහිර ගස
(ප්‍රා.ස)- ප්‍රාදේශීය සභා
හෙට්ටිවත්ත ඩබ්ලිව්.පී.ඉන්ද්‍රාවති හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී. රන්ජිත් ප්‍රේමසිංහ හිමිකම් කියයි
හෙට්ටිවත්ත ඒ.ඒ.ස්.කුමාර හිමිකම් කියයි
හෙට්ටිවත්ත ආර්.එෆ්. විමලරත්න හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී.කේ. රත්නායක හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී. සමරසිංහ හිමිකම් කියයි
හෙට්ටිවත්ත යූ.පී. ටිකිරි බන්ඩාර හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී.සුගත් පද්මසිරි හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී. සොපියා හිමිකම් කියයි
හෙට්ටිවත්ත ආර්.එෆ්. විමලරත්න හිමිකම් කියයි
හෙට්ටිවත්ත එච්.පී.සුගත් පද්මසිරි හිමිකම් කියයි
මාර්ගය
සභා සීමාව තුළ,
ම,හෙට්ටිවත්ත ගමෙහි පිහිටි
සාධක සමිතිය අසලින් ආරම්භ වි
8) ක මීටර් 2.4 පළල ප්‍රවේශ මාර්ගය
සටහන :- 1) ඉහත සඳහන් මාර්ගය දෙපස පදිංචි හිමිකරුවන්ගේ කැමැත්ත සහ මායිම් පෙන්වා දීම අනුව මෙම මැනීම සිදු කරන ලදී.
2) මාර්ගයේ දිග මීටර් 118.4 (අඩි 388.5 ආසන්නව)
මනින ලද දිනය :-2025-06-08
තු කරුණු

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ වූ කාර්යය පටිපාටිය අනුගමනය කිරීම සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 02 වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,459 හා 2025.10.17 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුනා වූ ඊට අදාළ නිවේදනය යටතේ උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වාගෙන යනු ලබන මංමාවත්/පාරවල් ලෙස මෙයින් නිවේදනය කරමි.

නලින් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 22 දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.


### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | කඩුගන්නාව පොත්තපිටිය මාර්ගයේ 7 කණුව අසලින් දිවෙන මාර්ගය | මාදිලිගම | කඩුගන්නාව පොත්තපිටිය මාර්ගයේ 7 කනුව අසලින් | කුඹුර අවසන් වන ස්ථානය | 1. එම්. ආර්. රත්න මැණිකේ මිය<br>2. එම්. ආර්. ප්‍රේමාවතී මිය<br>3. එම්. ආර්. ස්වර්ණතිලකා මිය | 1. ජී. ඩබ්. ජී. ටී. සේනාරත්න මයා | අඩි 175 | අඩි 10 | 10788 |

K.B.LANSAKARANAYAKE
REGD.LICENSED SURVEYOR
215, PILIMATHALAWA.

PLAN NO: 10788

A - B PROPOSED ROAD




REFERENCE
TP: TELEPHONE POST
ST: STAKE WOODEN

P L A N
OF
AN ALLOTMENT OF LAND CALLED
GANILADENIYE KUMBURA(PROPOSED ROAD)
SITUATED AT = ASWEDDUMA
G.S. = MADILIGAMA
In KANDUPALATHA KORALE OF YATINUWARA
A.G.A. = YATINUWARA
PRADESHIYA SABA = YATINUWARA
KANDY DISTRICT
CENTRAL PROVINCE

| CONTAINING IN EXTENT | | |
|---|---|---|
| LOT NO | A - R - P | (HECT:) |
| 1 | 0 - 0 - 09.72 | (0.0246) |

SURVEYED ON = 31.10.2024

K.B. LANSAKARANAYAKE (F.S.I.)
Registered Licensed Surveyor
(J: P. All Island)
215, Pilimatalawa

05-02/2

# විවිධ දැන්වීම්

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

### 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් 2026 ජනවාරි මස 16 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05:01:05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අරෝෂ අතපත්තු,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2026 අප්‍රේල් 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

කිසියම් වර්ෂයකට අදාළව ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා නියමිත ගාස්තු අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ගෙවා නොමැති නම් එදිනෙන් පසු නියමිත ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තුවට අතිරේකව, ප්‍රමාදවන එක් මසකට 10% බැගින් මුදලක් පැනවීමට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව යෝජනා කරන්නීය.

05-30/1

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

### නව කොළොන්නාව පාර ස්වයං රැකියා අලෙවිසැල පරිශ්‍රය ලබා දීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් 2026 වර්ෂය සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා වෙනත් වැඩසටහන් සඳහා භූමිය වෙන් කිරීමට අදාළව 2025.12.29 දිනැති මහා සභා තීරණ අංක 5:04:1(එ) 2025/11/මු/57 යටතේ ගන්නා ලද 2025.12.30 දිනැති අංක 2469/07 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද තීරණයට වැඩිමනත් වශයෙන්, 2026 ජනවාරි මස 16 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 5:1:6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අරෝෂ අතපත්තු,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2026 අප්‍රේල් 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1. ස්වයං රැකියාවල නියුතු ග්‍රාම නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිර්දේශ කරන ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ස්වකීය නිෂ්පාදන අලෙවි කිරීමට දිනකට රු. 300.00 + රජයේ අනුමත බදු සහිත මුදලකට තාවකාලිකව ස්ථාන ලබා දීම.

2. වෙනත් නිෂ්පාදන අලෙවිකරුවන්ට එම ස්ථානය දිනකට රු. 1,000.00 + රජයේ අනුමත බදු මුදලකට තාවකාලිකව ස්ථාන ලබා දීම.

3. වීථි ආහාර අලෙවි රථ සඳහා දිනකට රු. 300.00 + රජයේ අනුමත බදු සහිත මුදලකට තාවකාලිකව ස්ථාන ලබා දීම.

4. 2025.12.30 දිනැති අංක 2469/07 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පිටු අංක 20A පළ කරන ලද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2026 වර්ෂය සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා වෙනත් වැඩසටහන් සඳහා භූමිය වෙන් කිරීම, යටතේ දක්වා ඇති,

❖ "ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව ඉදිරිපිට ඉන්ටර්ලොක් අල්ලා ඇති ප්‍රදේශය සම්පූර්ණ කොටසම (වර්ග අඩි 160 x 110) සඳහා එක් දිනකට අය කරන ගාස්තුව රු. 100,000.00+රජයේ අනුමත බදු" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

05-03/2

---

**කල්පිටිය ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා සීමාව තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2026.03.10 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී අංක 07/2026/03/07/19 තීරණය යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එස්. එම්. රික්කාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු මස 23 දින,
කල්පිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ (1) උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) උපවගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් අංක 1843 හා 2013.12.27 දිනැති *ගැසට් නිවේදනය* මගින් වැළඳගන්නා ලද අතර, උක්ත සම්මත අතුරු ව්‍යවස්ථාවේ 17 වගන්තිය අනුව ක්‍රියාත්මක වීම සඳහා මහ සභා තීරණ අංක 07/2026/03/07/19 යටතේ 2026.03.10 දින කල්පිටිය ප්‍රාදේශීය සභා මහ සභාව විසින් ගන්නා ලද තීරණයට අනුව බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද නවතා තැබීම සඳහා අනුමත ස්ථානයන්හි ස්ථාපිත කරනු ලබන ත්‍රී රෝද රථ සංගම් හා එහි ලියාපදිංචි වන ත්‍රී රෝද රථ වලින් ගාස්තු අය කිරීම පහත සඳහන් අංක 01 උපලේඛනය පරිදි විය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය 01***

**ත්‍රී රෝද රථ සංගම් ලියාපදිංචිය**

1. සංගමය ලියාපදිංචිය සඳහා (එක් අවස්ථාවක දී පමණක් අය කරන) රු. 5,000.00

**ත්‍රී රෝද රථ සඳහා ගාස්තු**

1. එක් ත්‍රී රෝද රථයක් සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු. 500.00

05-22

## සංශෝධනයයි

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

### 2026 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු සංශෝධනය කිරීම

2025.12.26 දින පළ කරන ලද අංක 2,469 *ගැසට් පත්‍රයේ* 12-471 ගැසට් නිවේදනය යටතේ පළ කරන ලද 2026 වර්ෂයේ පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සේවා හා ගාස්තු සම්බන්ධ *ගැසට් නිවේදනයේ* 2026 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු පැනවීම අංක 01 යටතේ සඳහන් කර ඇති පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ ස්ථිර පදිංචිකරුවකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීම රු. 14,000.00 යන්න පරිච්චින්න කර හා අංක 02 යටතේ සඳහන් කර ඇති පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු නොවන අයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීම රු. 15,000.00 යන්න පරිච්චින්න කර 2026.04.07 දින පැවති මහ සභාවේ යෝජනා අංක 6.13 යටතේ දී පහත පරිදි ගාස්තු සංශෝධනය වන බව මෙයින් දන්වා සිටිමි.

ආර්. එම්. කේ. එස්. බී. රාජනායක,
ගරු සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

| *අනු. අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| 01 | පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | 15,000.00 |
| 02 | පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු නොවන අයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | 17,000.00 |

05-37

---

## ගාස්තු සංශෝධනය - 2026 වර්ෂය

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

### වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා කාබනික පොහොර අලෙවි කිරීම සඳහා ගාස්තු පැනවීම සංශෝධනය කිරීම

2025.12.26 දිනැති *ගැසට් පත්‍රයේ* 2,469 අංක යටතේ 2026 වර්ෂය සඳහා කාබනික පොහොර අලෙවි කිරීම සඳහා ගාස්තු පැනවීම 2026.04.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2026/04/07/ඊ/02(1) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඊ. ඒ. චන්දන එදිරිසිංහ,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 24 දින,
වරකාපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

කැටගොඩේවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අලෙවි කිරීම සඳහා 2026 වර්ෂයට අදාළ මිල ගණනන් 2025.10.02 දින පැවති ගරු මහ සභාවේ 2025/10/02/8/01 (XIX) අංක දරන යෝජනාව මගින් සම්මත කර *ගැසට් පත්‍රයේ* පළ කර ඇති බැවින් කැටගොඩේ වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පොහොර තොග විශාල වශයෙන් එකතු වළක්වා ගැනීම සඳහා 2026 වර්ෂයට විවිධ ගාස්තු පැනවීමේ 2025/10/02/ඊ/01 (XIX) අංක දරන එම යෝජනාවේ සඳහන් 2026 වර්ෂය සඳහා කාබනික පොහොර නිකුත් කිරීම යන කරුණ පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

**2026 වර්ෂය සඳහා කාබනික පොහොර අලෙවි කිරීම සඳහා ගාස්තු පැනවීම සංශෝධනය කිරීම**

| *අනු. අංක* | *පොහොර ප්‍රමාණය* | *කිලෝග්‍රෑම් ඒකක මිල (රු. ශත)* |
|---|---|---|
| 01 | කිලෝග්‍රෑම් 1 සිට කිලෝග්‍රෑම් 250 දක්වා | 20.00 |
| 02 | කිලෝග්‍රෑම් 250 සිට කිලෝග්‍රෑම් 1,000 දක්වා | 15.00 |
| 03 | කිලෝග්‍රෑම් 1001 ට වැඩි නම් | 08.00 |

05-32

---

සංශෝධනය කිරීම යි

**ඉමදූව ප්‍රාදේශීය සභාව**

ඉමදූව ප්‍රාදේශීය සභාව විසින් 2026.11.07 දිනැති අංක 2,462 දරන ගැසට් පත්‍රයෙහි පහත සඳහන් උපලේඛන පහත පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වා සිටිමි

ඇමුණුම 01

සභාව සතු පොදු ක්‍රීඩාංගන සඳහා ගාස්තු පැනවීම - 2026 වර්ෂය

| *උපලේඛනය* | *සම්පූර්ණ ක්‍රීඩාංගනය සඳහා දිනකට ගාස්තුව* | *රු. ශත* |
|---|---|---|
| අංක 02, V | බෝගහගොඩ යෝජිත සතිපොල භූමිය (දිනකට) | 15,000.00 |

පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු හා ඉමදූව ප්‍රාදේශීය සභාව සතු දේපළ හා ඉමදූව ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු අය කිරීම. 2026 වර්ෂය

| | | |
|---|---|---|
| I උපලේඛනය අංක 26 | ගල්රෝල මගින් සේවා ගාස්තු පැය 8 ක කාලයක් සඳහා (ඉන්ධන නොමැතිව රියදුරු සහිතව) | රු. 18,000.00 |
| | පැය 8ට වඩා වැඩිවන සෑම පැයකටම (දිස්ත්‍රික් මිල ගණන් අනුව විචලා වේ.) | රු. 2,000.00 |

| | | |
|---|---|---|
| II උපලේඛනය අංක 01 | බහු කාර්ය ගොඩනැගිල්ල උඩු මහල් ශ්‍රවනාගාරය බදු දීම දිනකට | රු. 15,000.00 |
| | ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා දිනකට | රු. 8,000.00 |
| | වායු සමීකරණ සඳහා දිනකට | රු. 7,000.00 |
| | දේපළ හා උපකරණ වලට හානියක් සිදු වුවහොත් තක්සේරු කරන අලාභය ගෙවිය යුතුය. | |

ඩී. එස්. කේ. කෞශල්‍යා ගුණසේකර,
ලේකම්,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

05-33

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

**2026 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **මැයි** | 2026.05.08 | සිකුරාදා | 2026.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.05.15 | සිකුරාදා | 2026.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2026.05.22 | සිකුරාදා | 2026.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.05.29 | සිකුරාදා | 2026.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූනි** | 2026.06.05 | සිකුරාදා | 2026.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.12 | සිකුරාදා | 2026.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.19 | සිකුරාදා | 2026.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.26 | සිකුරාදා | 2026.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
*රජයේ මුද්‍රණාලයාධිපති.*

2026 අප්‍රේල් මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.